Page 1 December 2011.qxd 23/12/2011 16:49 Page 1


# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 14
NUMBER 08

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

DECEMBER 10, 2011 දෙසැම්බර් මාසය (බුද්ධ වර්ෂ 2555 උඳුවප් මාසය) http://www.lankaheritage.com/lankaviththi/


පාඨක ඔබ සැමට සුබ නත්තලක් වේවා! Wishing You A Happy Christmas!



දිව රෑ දෙක්හි මව් උණුසුම පතා ය
නිහඬව සිටින මුත් බොහො දේ සිතා ය
මතු ලොව පිදුම් ලබනා නැණ වතා ය
මවකට ඇගේ පණ මේ පොඩි පුතා ය

**All day his mother's caring warmth he sought**
**Though quiet, his tiny mind is steeped in thought**
**One day he will be revered as a sage worldwide**
**This little son is mother's life and also her pride**

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*

The Virgin Mary and Christ Child are depicted in the icon of the Theotokos-or Mother of God - from the Byzantine-Ruthenian chapel at the Basilica of the National Shrine of the Immaculate Conception in Washington, USA.

***මෙම දේව මාතාව සහ ජේසු බිළිඳුන් වොෂිංටන් නුවර ප්‍රධාන දේවස්ථාන යක තිබෙන ප්‍රතිමාවකි***

# මේ ගමනේ ප්‍රාතිහාර්යය නැත!

♦ **සංජය විමලරත්න විසිනි**

**මේ** නත්තල් සමයයි. මෙය සාමයේ කුමරුන් ලෙස ලොව බොහෝ දෙනා බුහුමන් කරන ජේසු බිළිඳුන් වසර දෙදහසකට ඉහත උපන්දිනය සිහිකරන කාලයයි. එහෙත් අද බලන බලන අත අපට දක්නට ඇත්තේ කරදර අවුල් සහ දුක්ඛ දෝමනස් සයන්ය. බොහෝ දේ උඩුයටිකුරුවී ඇත. ජේසු උපත සමග ලොවට දායාද කළ සාමයේ පණිවුඩය වෙන කවරදාකටත් වඩා අවශ්‍ය කාලයකි මේ.

ජේසුස් වහන්සේ උපත ලදුයේ බලවත් රෝම අධිරාජ්‍යය අතීත ලෝකය අයෝමය ලෙස පාලනය කළ වකවානුවේදීය. ඒ අධිරාජ්‍යය උන්වහන්සේට හිරිහැර කළේ, වධහිංසා පැමිණ වූයේ දිළින්දන් වෙත සාමයේ පණිවුඩය දේශනා කළ නිසාය. එසේම ඉතිහාසය තුළින් අපට පැහැදිලිවන්නේ ඒ අධිරාජ්‍යයන් ඒ බලය හේතුකොට ගෙනම විනාශ වී ගිය හැටිය. ඒ සියල්ලද සිහියට ගනිමින් මෙම ලිපියෙන් අදහස් කරන්නේ ශ්‍රීලංකාවේ මෑතක වූ සිද්ධීන් දෙස අප රට මෙන්ම ලෝකයටද අනුරූපව බලමින් කිසියම් විමර්ශනයක යෙදෙන්නටය. එමගින් වඩා හොඳ අනාගතයක් කරා අප ජනතාව යොමුකිරීමේ අරමුණෙන් ද යුතුව ය.

## ශ්‍රීලංකාවේ සිදුවීම් වලින් කීපයක්

## පාර්ලිමේන්තුවට අය වැය ඉදිරිපත් කළ දා

මෑතදී වැදගත් අවස්ථාවක් වූයේ අයවැය ලේඛනය පාර්ලිමේන්තුවට ඉදිරිපත්කිරීමයි. එය සාමාන්‍යයෙන් කවදත් ජනතාව දකින්නේ ඇල්මැරුණු ස්වභාවයකිනි. විශේෂිත දෙයක් එහි නැත. එහෙත් එය මෙවර වෙනස් මුහුණුවරක් ගත්තේය. නොවැම්බර් 21 වන දින මුදල් ඇමතිවරයා වශයෙන් ද කටයුතු තරන ශ්‍රීලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා අය වැය ඉදිරිපත් කරන්නට සූදානම් වත්ම පාර්ලිමේන්තුව තුළ මන්ත්‍රීන් අතරේ කිසියම් නොසන්සුන්තාවක් ඇතිවන ලකුණු පෙනිණ.

සැණෙකින් එය මන්ත්‍රීවරුන් පිරිසකගේ ගාලගෝට්ටියෙන් යුත් උද්වේගකර නාටකයක් බවට පරිවර්තනය විය. ජනාධිපතිවරයා නැගිට කතාව ආරම්භ කරත්ම මන්ත්‍රවරුන් කීපදෙනෙක් කලින් ඔවුන් සූදානම් කරගෙනැවිත් තිබුණු වගන්ති පුවරු වගයක් ඔසවා වටේට පෙන්වමින් සෝෂාකරන්නට වූහ. 'ලැජ්ජයි' (Shame) යන වචන භාෂා තුනෙන්ම එහි ලියා තිබුණේ ය. එය කෙරුණේ ප්‍රධාන වශයෙන් එක්සත් ජාතික පක්ෂයට අයත් මන්ත්‍රීවරුන් අතිනි. ජවිපෙ TNA හා DNA පක්ෂවල මන්ත්‍රීවරු මෙම නාටක රඟපෑම බලාගෙන සිටියෝය. මෙම ක්‍රියාව තනි කරම අය වැය ඉදිරිපත්කිරීමට බාධාකරන්නට හිතාමතාම ගත් උත්සාහයකි. එසේම එය විදේශ තානාපති නියෝජිතයින්ද ඇතුළු ලෝකයටම පෙනෙන සේ සජීවී විකාශනයට හසුවන පරිද්දෙන් සිදුකිරීම ඔවුන්ගේ අභිප්‍රාය වූ බව ද පෙනේ.

එම කලබැගෑනිය කරන්නට මූලික හේතුව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ගෝරියට ඇද ගැන්මේ අදහසින් විය හැකිය. එය ඒ අයුරින්ම ඉෂ්ට විය. ඔවුන් ඒ උගුලට අසුවිය. ආණ්ඩුපක්ෂයේ තරුණ මන්ත්‍රීවරුන් කීප දෙනෙක් තම ලොක්කාට පක්ෂපාතිත්වය පෙන්වන්නට සිතා ඒ විපක්ෂයේ සෝෂාකාර මන්ත්‍රීවරුන්ට පහර දීමට එතැනට දිව ගියෝය. කමිස වලින් හා බෙල්ලෙන් අල්ලා එකිනෙකා තල්ලු කරමින් ඔවුන් ප්‍රදර්ශණය කළ බෝඩ් ලෑලි උදුරා ගන්නට මහා කලබලයක් කරන්නට වූහ. වතුර බෝතල් ද ඒ මේ අත විසිවනු පෙනින. එක බෝතලයක් උඩින් ඇවිත් ජනාධිපතිවරයා ළඟම වැටුණේ ය. මේ අශෝභන ක්‍රියාදාමය සජීවී ලෙස රූපවාහිනිය විසින් විකාශනය කරන ලදී.

සෑහෙන වෙලාවක් පැවතුණු මෙම කලබැගෑනිය අවසන්වූයේ ජනාධිපතිවරයාද. කතානායකවරයාද යන දෙදෙනාම එම කලහකාරී මන්ත්‍රීවරුන්ට තම ආසන වලට ගොස් අසුන්ගන්නා ලෙස කීප විටක්ම ඉල්ලා සිටීමෙන් අනතුරුව ය. ආපසු සභාවේ වැඩ ඇරඹුණද එවිට විය යුතු හානිය සිදුවී හමාර ය.

කතානායකවරයා මෙම සිද්ධියට තුඩු දුන් හේතුන් ගැන සොයා බලන්නට ද එයට අදාල මන්ත්‍රීවරුන්ට එරෙහිව විනයානුකූල දඬුවම් ලබාදෙන්නට ද කටයුතු සූදානම්කර ඇති බව ඇසේ. එහෙත් මේ සියල්ල ඇති කළ නීරස ප්‍රතිපලය නම් මේ තුළින් රටේ ගෞරවනීය ස්ථානයක ගෞරවය ආරක්ෂාවන අයුරින් හැසිරෙන්නට නොදන්නා නොහික්මුණු පිරිසක් එතැනට පත්ව සිටින බව මනාව ප්‍රදර්ශනය වීමයි. යූ ඇන්පී මන්ත්‍රීවරුන් එසේ හැසිරුණේ දැනට තමනට හරි හමන් නායකයෙකු නැති නිසා යයි සිතිය හැකි වුවත් අපට වහා සිතට වැදුණේ බලයේ සිටින ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් තම නායකයා ඉතා වැදගත් කතාවක් කරන

4 වන පිටුවට →




අපගේ හිතවත් ගණුදෙනුකාර භවතුන් සැමට සාමය සතුට පිරි, අසිරිමත් නත්තලක් සහ සුබ නව වසරක් වේවා!

FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3